RARE

# විදේශ රැකියාවල නියුක්ත ශ්‍රී ලාංකික විවාහක කාන්තාවන්ගේ දූදරුවන් සමාජානුයෝජනය වීම පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව් සාවිත්‍රී ලේබාපි කුලතිලක
ශාස්ත්‍රවේදී කැලණිය

SOCI/M/08R/97

333
වර්ග අංකය

ස. වි. ප. ති
2002 කැ. වි. වි.

# නිබන්ධ සාරාංශය

කුඩා ළමයකුට දෙමව්පියන්ගෙන් ලැබෙන ආදරය හා සෙනෙහස ඔහුගේ පෞරුෂත්ව වර්ධනය කෙරෙහි බෙහෙවින්ම බලපායි. මවගෙන් නියමිත ආදරයක් සෙනෙහසක් නොලැබීමෙන් ළමුන් තුළ ගොඩනැගෙන්නේ සෙනෙහසෙන් තොර පෞරුෂත්වයකි. නූතන සමාජ වෙනස්වීම අනුව තීව්‍ර වන ආර්ථික පරිසරයක් ශ්‍රී ලංකාවේ ගොඩනැගී ඇත. මෙහි ප්‍රතිඵලය දරුවන්ගේ සමාජානුයෝජනයට බලපා ඇත්තේ අහිතකර ලෙසිනි. දරුවන් තම නෑයන්ගේ හා මව්පියන්ගේ නිවෙස් වල රඳවා තැබීම හෝ මෙහෙකරුවන්ගේ භාරයේ තැබීම නූතනයේ බොහෝ පවුල් වල දක්නට ලැබෙන සුලභ සිද්ධියකි. දෙමව්පියන් විදේශ රටවලට සංක්‍රමණය වීම ඔවුන්ගේ දරුවන්ගේ සමාජානුයෝජනය කෙරෙහි සිදුකර ඇති බලපෑම කවරේද යන්න පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ඒ ඇසුරෙන් "විදේශ රැකියාවල නියුක්ත ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ දූ දරුවන් සමාජානුයෝජනය වීම සහ ඒ ආශ්‍රිත ගැටලු යන මාතෘකාව යටතේ පර්යේෂණ අධ්‍යයනයක් කරනු ලැබීය."

මෙම සමීක්ෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් කරනු ලැබුවේ බස්නාහිර පළාත නියෝජනය වන පරිදි පවුල් 200 ක සසම්භාවී ස්තෘත නියැදි යටතේය. ඊට ඇතුලත් කරගත් ප්‍රතිග්‍රාහකයන් නම් විදේශ රැකියා සඳහා ගොස් පැමිණි මව්වරු. එතෙර ගිය මව්වරුන්ගේ ස්වාමිපුරුෂයන්. ඔවුනගේ දරුවන්. දරුවන් භාරකොට ගිය ඥාතීන්. එම දරුවන්ගේ ගුරු භවතුන් සහ අසල්වැසි ජනමත නායකයින්ය. මේ පිරිසගෙන් තොරතුරු ලබා ගැණුනේ සම්මුඛ සාකච්ඡා සහ දෙන ලද ප්‍රශ්නාවලියක් මාර්ගයෙනි.

දත්ත විශ්ලේෂණය කිරීමේදී සම්මුඛ සාකච්ඡා. ප්‍රශ්නාවලි සහ ප්‍රත්‍යෙක අධ්‍යයනය තුලින් එක්රැස් කරන ලද කරුණු යොදාගනු ලැබිණි. ඒ ඇසුරින් මෙම පවුල්වල ආර්ථික තත්ත්වය. රැකියා ව්‍යුහය. මව්වරුන් විදේශ ගත වීමට බලපෑ හේතු. අන්‍යොන්‍ය වශයෙන් සමාජයේ පැවැත්මට පවුල් සංස්ථාව විෂයයෙහි තිබිය යුතු කෘත්‍යයන්. දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියට ඇති වී තිබෙන බාධාවන් සහ සමාජ ප්‍රශ්න පිළිබඳවත් විවරණයක් කළ හැකි විය.

පර්යේෂණයේ නිගමනයන් වූයේ මේ පවුල් තුළ අපේක්ෂාවන් ඉටුවීමට වඩා අපේක්ෂාවන් ව්‍යර්ථවීම තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් ඇති බවයි. පවුල් තුළ සාමූහිකත්වය ගිලිහී යාම හා සමාජිකයින් විවිධ මානසික ගැටලු වලට බඳුන් වීමද. පියවරුන්. මව්වරුන් සහ දරුවන් එකිනෙකාට දුරස්ථ වීම් ද ඒ තුළින් ගොඩනැගුනු මානසික අවපීඩනයන් සහ නොයෙකුත් ව්‍යසන වලට බඳුන් වීමද ප්‍රත්‍යක්ෂ විය.

විදේශ රැකියා මගින් රටට විශාල විනිමය ප්‍රමාණයක් ලබාදෙමින් සාර්ව ආර්ථික ප්‍රශ්න වලට විසඳුම් සෙවීමේදී විශාල පිටිවහලක් දෙන මෙම ශ්‍රම සම්පත ආරක්ෂා කරමින් අදාල පවුල් සංස්ථාවල සමෘද්ධිමත්භාවය. සාරධර්ම. ප්‍රතිමාන. අන්‍යොන්‍ය සුහදත්වය. නිරෝගී. සෞඛ්‍යය සම්පන්න පරපුරක් බිහිකිරීම සහ ඔවුන් සුසමාජානුයෝගීන් බවට පත්කිරීමටත් පියවර ගත යුතු බව යෝජනා කෙරේ.